# HDFC බැංකුව

නවාස මූල්‍ය විසඳුම් හරහා ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු සමස්ත ශ්‍රී ලාංකිකයින්ගේ අභිලාෂ ඉටු කර ගැනීම සඳහා දශක තුනකට අධික කාලයක් පුරා දැයට මහඟු සේවයක් ඉටු කරන **HDFC** බැංකුව හා සම්බන්ධ වී ඔබේ වෘත්තීය ජීවිතය ඉදිරියට ගෙන යාමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

බැංකුකරණ ක්ෂේත්‍රයේ සැබෑ වෙනසක් ඇති කිරීමට **HDFC** බැංකුව සූදානමින් සිටින බැවින් පහත සඳහන් තනතුර සඳහා දක්ෂ, ක්‍රියාශීලී, බැංකුකරණ ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට අප හා එක් විය හැකිය.

**සහාය ඉන්ජිනේරු (තොරතුරු තාක්ෂණ) [ශ්‍රේණිය IV]**

**වගකීම්**

- පර්යේෂණ කිරීම, ගැටලු නිර්ණය කිරීම, දෝෂ නිරාකරණය කිරීම සහ නිවැරදි හා කාලෝචිත ආකාරයෙන් පාරිභෝගික ගැටලුවලට විසඳුම් සැපයීම.
- විවිධාකාරයේ පද්ධති, මෘදුකාංග සහ දෘඩාංග සමඟ කටයුතු කිරීම.
- සුදුසු අභ්‍යන්තර දෙපාර්තමේන්තු වෙත නොවිසඳුණු ගැටලු යොමු කිරීම සඳහා සම්මත ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම.
- යෙදවුම් අලෙවි කරන්නන් සමඟ සමීපව කටයුතු කිරීම.
- කෙටි කාලයක් තුළ ගැටලු නිරාකරණය කිරීම.
- උපරිම සහාය ගැනීම සඳහා යටත් නිලධාරීන් පුහුණු කිරීම.
- පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණය (UAT) සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වීම.
- යෙදවුම් හා පද්ධති සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමට, දෝශ නිරාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීමට, සහාය ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට සහ තාක්ෂණික ගැටළු හැසිරවීමට සහාය වීම.

**සුදුසුකම්**

- පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද සමඟ පරිගණක විද්‍යාව පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
  හෝ
- පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර තුනක පළපුරුද්ද සමඟ පිළිගත් ඩිප්ලෝමාවක් ලබා තිබීම. (අවම වශයෙන් වසරක කාල සීමාවක් සහිත ඩිප්ලෝමාවක් ලබා තිබීම.)
- Java, dotNet, mobile application, C# සහ Oracle SQL භාවිතා කරමින් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක මෘදුකාංග සංවර්ධනයට දායක වී තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස් සීමාව**

- වයස අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

සිත් ගන්නා වැටුප් සහ දීමනා හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය**

- විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි (**Subject**) ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 06.12.2023 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.


HDFC බැංකුව
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැපැල් පෙට්ටිය 2085
කොළඹ 02
දුරකථනය : 0112356800